ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

# පරීක්ෂක වාර්තාව

AA1 විභාගය - ජනවාරි 2017

## (AA13) ව්‍යාපාර සහ ගිණුම්කරණය සඳහා ආර්ථික විද්‍යාව

(Economics for Business and Accounting)

---

ආර්ථික විද්‍යා ප්‍රශ්න පත්‍රයට උත්තර සැපයිමේදි අයදුම්කරුවන් බොහෝමයක්ම සාර්ථකව පිළිතුරු සපයා තිබුනි. එහෙත් සමහර ප්‍රශ්න සඳහා උත්තර සැපයිමේදි අයදුම්කරුවන් පහත අඩුපාඩුකම් සිදුකර තිබුණි. ඊට හේතු ලෙස උත්තර පත්‍ර පරීක්ෂකවරුන් පහත කරුණු නිරීක්ෂණය කර ඇත:

## A - කොටස

එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් අනිවාර්ය ප්‍රශ්න 20 කි. මුළු ලකුණු 40 කි.

### ප්‍රශ්න අංක 01

විෂය නිර්දේශයෙහි පුළුල් පරාසයක් ආවරණය වන පරිදි සකසා ඇති 1 වැනි ප්‍රශ්නය තුලින් මුළු ලකුණු ප්‍රමාණයෙන් 40% ලකුණු ප්‍රමාණයක් අත්පත් කරගැනීමේ හැකියාව පවතී. මෙම ප්‍රශ්න ආර්ථික විද්‍යාවේ මූලික න්‍යායන් හා සංකල්ප පදනම් කරගනිමින් විෂය නිර්දේශයේහි බර තැබීම් වලට උචිත ලෙස ඉදිරිපත්ව ඇත.

වරණ අතුරින් නිවැරදි උත්තරය තෝරා ගැනිම, සත්‍ය හෝ අසත්‍ය බව දැක්වීම, සාමාන්‍ය දැනුම ඔස්සේ ගැටලු ඉදිරිපත් කිරිම යනාදි විවිධ ක්‍රම ඔස්සේ ඉදිරිපත්වූ මෙම ප්‍රශ්නයට උත්තර සැපයිමේදි බොහෝ අයදුම්කරුවන් සාර්ථක සාධනීය මට්ටමකට එළඹ තිබුණි.

කෙසේවුවද උත්තර පත්‍ර පරීක්ෂකවරුන්ගේ අවධානයට ලක්වූ, පහත සඳහන් ප්‍රශ්න සඳහා අයදූම්කරුවන් විසින් සිදුකර ඇති අඩුපාඩු කිහිපයක් පහත දැක්වේ:

**1.1** සැපයුම් නීතිය යනු මිල සහ සපයනු ලබන ප්‍රමාණය අතර සම්බන්ධතාවයක් බව බොහෝ අයදුම්කරුවන් නිවැරදිව හඳුනාගෙන තිබුණි. සමහර අයදුම්කරුවන් ප්‍රශ්නය නිසියාකාරව අවබෝධ කර නොගැනීම නිසා හෝ අවධානයෙන් කියවා නැතිවීම නිසා හෝ සැපයුම් නීතියෙන් පැහැදිලි කෙරෙන්නේ සැපයුමේ වෙනස්වීම සහ ආදායමේ වෙනස්වීම අතර සම්බන්ධතාවය, සපයනු ලබන ප්‍රමාණයේ වෙනස්වීම සහ ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණයේ වෙනස්වීම අතර සම්බන්ධතාවය ලෙස වැරදි උත්තර සපයා තිබුණි.

**1.2** රටක නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක, "X" ලක්ෂ්‍යයෙන් මායිම් සම්පත් වල පූර්ණ සේවා නියුක්තිය පෙන්වන බව බොහෝ අයදුම්කරුවන් නිවැරදිව හඳුනාගෙන තිබුණි. එහෙත් සමහරු වැරදි ලෙස තෝරාගෙන තිබුණේ 4 වෙනි වරණය වන අනාගත ආර්ථික වර්ධනයේ වේගවත් අනුපාතිකයක් යන්නයි. අයදුම්කරුවන් විසින් නිෂ්පාදන හැකියා මායිම් වක්‍ර පිළිබඳව අවබෝධය දියුණු කරගත යුතුය.

**1.3** බොහෝ අයදුම්කරුවන් පාරිභෝගික අතිරික්තය රු. 250/- බව නිවැරදිව ගණනය කර තිබුණි. නමුත් සමහරු පාරිභෝගික අතිරික්තය රු.500/- ලෙස වැරදි වරණයන් දක්වා තිබුණි.

**1.4** හරස් මිළ ඉල්ලුම් නම්‍යතාවය 0.25 වුවද එය + 0.25 විය යුතුය. නිවැරදි පිළිතුර ලෙස - 0.25 ලෙස තෝරාගෙන සිටි සිසුන් සමහරක් සිටින ලදී. මෙවැනි ප්‍රශ්න වලදී (+) / (-) සලකනු සම්බන්ධයෙන් අයදුම්කරුවන් වැඩි අවධානයක් යොමු කළ යුතුය. හරස් මිල ඉල්ලුම් නම්‍යතා සමීකරණයේ ලවය හා හරය මාරුකිරිම නිසා සමහර සිසුන් 8 / 2 = + 4.0 ලෙස වරදි වරණයක් වන (3) වන උත්තරය නිවැරදි වරණය ලෙස තෝරාගෙන තිබුණි.

**1.5** මෙම ප්‍රශ්නය සම්පූර්ණයෙන් පැහැදිලිව නොකියවූ අයදුම්කරුවන් වැරදි උත්තර තෝරාගෙන තිබුණි. අයදුම්කරුවන් සැහෙන ප්‍රමාණයක් නිවැරදි උත්තරය වූ වරණ සියල්ලම නිවැරදි බව හඳුනා ගැනීමට අසමත්ව තිබුණි. බොහෝ අයදුම්කරුවන් රජය සඳහා බදු ආදායම් උපයා ගැනීම (01 වන උත්තරය) පමණක් තෝරාගැනීමෙන් ලකුණු අහිමි කරගෙන තිබුණි.

**1.6** පොදු භාණ්ඩවල ලක්ෂණයක් හඳුනා ගැනීමට තිබූ මෙම ප්‍රශ්නයෙහි උත්තරය ලෙස බොහෝ අයදුම්කරුවන් 01. වන වරණය වන පරිභෝජනයේ තරඟකාරිත්වයක් ඇතිවීම ලෙස වැරදියට දක්වා තිබුණි.

**1.7** සමහර අයදුම්කරුවන් රාජ්‍ය අයවැයක ප්‍රධාන අරමුණක් නොවන්නේ යන්න වෙනුවට රාජ්‍ය අයවැයක ප්‍රධාන අරමුණක් වන්නේ ලෙස තේරුම් ගැනීම නිසා වැරදි උත්තර සටහන් කර තිබුණි. බහුවරණ ප්‍රශ්නයකදී උත්තරයෙන් බලාපොරොත්තු වන්නේ කුමක්දැයි අයදුම්කරුවන් පැහැදිලිව තේරුම් ගත යුතුය.

**1.8** ආර්ථික විද්‍යාවට අදාල සංඛ්‍යා දත්ත අධ්‍යයනය නොකිරීමේ ගැටළුව නිසා බොහෝ අයදුම්කරුවන්ගේ උත්තර නිවැරදි නොවීය. ආර්ථික විද්‍යාව හැදෑරීමේදී අයදුම්කරුවන් විසින් මහබැංකු වාර්තාව පරිශීලනය කිරීම අනිවාර්යයෙන්ම සිදුකළ යුතුය. මෙය ආර්ථික විද්‍යා විෂය කරුණු වල ප්‍රායෝගික භාවිතයන් වටහා ගැනීමට මහෝපකාර වේ.

**1.9** ජාතික ආදායමේ චක්‍රීය ප්‍රවාහයෙන් ගිලිහීමක් / කාන්දුවීමක් (leakage) ලෙස ඉතිරිකිරීම් යන්න හඳුනා ගැනීමට බොහෝ අයදුම්කරුවන් සමත් වී තිබුණි. සමහර අයදුම්කරුවන් ගිලිහීම් සහ විදීම් පටලවා ගැනීම නිසා ආයෝජන ආදී වැරදි උත්තර සපයා තිබූ අවස්ථාද දක්නට ලැබුණි.

**1.10** ආර්ථිකයක ප්‍රාග්ධන සම්පත් ප්‍රමාණය වැඩිවීම සිදුවන්නේ ආර්ථිකයක් එහි ප්‍රාග්ධන තොග වැඩිකරන විට යන්න බොහෝ අයදුම්කරුවන් නිවැරදිව හඳුනාගෙන තිබුණි.

**1.11 - 1.15** ගැටළු සඳහා සත්‍ය හා අසත්‍ය බව දැක්වීමට පවසා තිබුණද, බොහෝ අයදුම්කරුවන් සත්‍ය බවට "✓" ලකුණද අසත්‍ය බවට "×" ලකුණද ලෙස ලියා තිබුණි. විභාගයේ අසා ඇති ප්‍රශ්නවලට දී ඇති උපදෙස් පිළිපදිමින් නිසිලෙස පිළිතුරු ලිවීමට අයදුම්කරුවන් පුරුදු විය යුතුය.

**1.11** සැපයුම වෙනස් නොවී භාණ්ඩයක් සඳහා ඇති ඉල්ලුම වැඩිවීම, එම භාණ්ඩයේ සමතුලිත මිල සහ සමතුලිත ප්‍රමාණය යන දෙකෙහිම වැඩිවීමට හේතු වේ යන්න සත්‍ය ප්‍රකාශයක් වුවද සමහර අයදුම්කරුවන් එය අසත්‍ය ලෙස දක්වා තිබුණි. ඉල්ලුම සැපයුම අනුව සමතුලිත මිල සහ ප්‍රමාණය කෙසේ වෙනස්වේදැයි යන්න පිළිබඳව අයදුම්කරුවන් තුළ පැහැදිලි අවබෝධයක් ගොඩනගා ගත යුතුය.

**1.12** කතිපයාධිකාරය (oligopoly) යටතේ, වෙළෙඳපොලෙහි නිෂ්පාදකයන් / විකුණුම්කරුවන් සහ ගනුදෙනුකරුවන් විශාල සංඛ්‍යාවක් සිටී යන ප්‍රකාශය අසත්‍ය වුවද පූර්ණ තරඟකාරී වෙළෙඳපොළ සමග පටලවා ගැනීම නිසා සමහර අයදුම්කරුවන් උත්තරය සත්‍ය ලෙස දැක්වීමෙන් ලකුණු අහිමිකරගෙන තිබුණි.

**1.13** මෙම ප්‍රශ්නයට නිවැරදි උත්තරය සත්‍ය වුවද එය අසත්‍ය ලෙස දක්වා තිබූ අයදුම්කරුවන් ද දැකිය හැකි විය. වෙළෙඳපොළ ආර්ථික ක්‍රමය තුළ රජයේ මැදිහත් වීම සඳහා ප්‍රධාන හේතුව වන්නේ වෙළෙඳපොළ බිඳවැටීම් නිවැරදි කිරීම බව අයදුම්කරුවන් තේරුම් ගත යුතුය.

**1.14** ස්ථාවර විනිමය අනුපාතය තීරණය කිරීම පිළිබඳව දක්වා තිබූ මෙම ප්‍රකාශය අසත්‍ය වුවද ඇතැම් අයදුම්කරුවන් එය සත්‍ය ලෙස දක්වා තිබුණි.

**1.15** තිරසාර සංවර්ධනය පිළිබඳ වූ මෙම ප්‍රකාශය අසත්‍ය වුවද ඇතැම් අයදුම්කරුවන් එය සත්‍ය ලෙස දක්වා තිබුණි. තිරසාර සංවර්ධනයක් ළඟාකර ගැනීම සඳහා ආර්ථික, සමාජීය සහ පාරිසරික යන අංශ සියල්ලෙහිම තුලනාත්මක වර්ධනයක් සිදුවිය යුතු බව අයදුම්කරුවන් අවබෝධ කරගත යුතුය.

**1.16** බොහෝ අයදුම්කරුවන් නිවැරදි පිළිතුර උපයෝගිතාවය ලෙස හඳුනාගෙන තිබුණි. නමුත් සමහර අයදුම්කරුවන් ප්‍රශ්නය නිවැරදිව නොකියවීම නිසා ලාභ ලෙස සටහන් කිරීමෙන් ලකුණු අහිමි කරගෙන තිබුණි.

**1.17** අවම මිල පනවනු ලබන්නේ පාරිභෝගිකයින්ට බව සමහර අයදුම්කරුවන් වැරදි ලෙස අවබෝධ කරගෙ තිබුණි. බොහෝ අයදුම්කරුවන් අවම මිල පනවන්නේ නිෂ්පාදකයින්ගේ යහපත සඳහා වන බව නිවැරදි ලෙස අවබෝධ කරගෙන තිබුණී.

**1.18** ෆිස්කල් ප්‍රතිපත්තිය යනු රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය වන බව සමහර අයදුම්කරුවන් අමතක කිරීම නිසා මුල්‍ය ප්‍රතිපත්තිය ලෙස සටහන් කිරීමෙන් ලකුණු අහිමි කරගෙන තිබුණි.

**1.19** රටකට වෙනත් රටකට වඩා අඩු ආවස්ථික පිරිවැයකින් භාණ්ඩ නිපදවිය හැකිවීම හඳුන්වනු ලබන්නේ නිරපේක්ෂ වාසිය ලෙස බව සමහර අයදුම්කරුවන් වැරදි ලෙස අවබෝධ කරගෙන තිබුණි. මේ සඳහා නිවැරදි උත්තරය වන්නේ සාපේක්ෂ වාසිය යන්නයි.

**1.20** සමහර අයදුම්කරුවන් යෙදවුම් වැඩිවන විට යන යෙදුම පමණක් කෙරෙහි අවධානය යොමුකර වැඩෙන පරිමාණනුකූල ඵල ලෙස වැරදි ආකාරයට නිගමනය කර ඇත. මෙහි උත්තරය සියලුම යෙදවුම් වැඩිවන වේගයට වඩා අඩු අනුපාතයකින් නිමවුම වැඩිවීම නිසා හීනවන පරිමාණානුකූල ඵල ඇතිවන බවයි.

## <u>B කොටස</u>

එක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් අනිවාර්ය ප්‍රශ්න 4 කි.

### ප්‍රශ්න අංක **02**

(a) (i) සමහර අයදුම්කරුවන් මෙම ප්‍රශ්නයට ආර්ථිකයක ප්‍රධාන ආර්ථික සම්පත් දීර්ඝ ලෙස විස්තර කිරීම දක්නට ලැබුණි. නමුත් මෙහිදී උත්තරෙන් බලාපොරොත්තු වූයේ ලැයිස්තුගත කිරීම පමණි. අයදුම්කරුවන් බහුතරයක්ම වාගේ ආර්ථිකයක ප්‍රධාන ආර්ථික සම්පත් සාර්ථකව ලැයිස්තුගත කර තිබුණි.

(ii) ආවස්ථික පිරිවැය සංකල්පය බොහෝ අයදුම්කරුවන් නිවැරදිව පැහැදිලි කර උදාහරණ සපයා තිබුණි. එහෙත් සමහර අයදුම්කරුවන් එය නිවැරදිව පැහැදිලි කළද, ආවස්ථික පිරිවැය සඳහා උදාහරණ පැහැදිලිව ඉදිරිපත් කිරීමට අපොහොසත් විය. තවත් සමහර අයදුම්කරුවන් ආවස්ථික පිරිවැය සංකල්පය පැහැදිලි කිරීමේදී නිවැරදි උත්තරය වන යම් තෝරා ගැනීමකදී අත්හරින ලද ඊළඟ හොඳම විකල්පයේ වටිනාකම ලෙස නොව විකල්ප සියල්ලෙහිම වටිනාකම ලෙස දක්වා තිබුණි.

(b) වෙළඳපොල ආර්ථික ක්‍රමයේ ලක්ෂණ බොහෝ අයදුම්කරුවන් පැහැදිලිව, කරුණු සහිතව පෙළගස්වා තිබුණි. එහෙත් සුළු අයදුම්කරුවන් ප්‍රමාණයක්, වෙළෙඳ පොළ ආර්ථිකය වෙනුවට පූර්ණ තරඟකාරී වෙළඳපොළක ලක්ෂණ ලියා තිබුණි. තවත් සමහර අයදුම්කරුවන් ලක්ෂණ 5ක් වෙනුවට 3 ක් හෝ 4 ක් පමණක් සඳහන් කර තිබුණි. තවද මෙවැනි ප්‍රශ්නවලදී ලක්ෂණ නිශ්චිතව සඳහන් කිරීම මිස පැහැදිලි කිරීම අනවශ්‍ය බව අයදුම්කරුවන් අවබෝධ කරගත යුතු වේ.

**ප්‍රශ්න අංක 03**

(a) ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතියේ ඇතුළත් ආයතන බොහෝ සිසුන් නිවැරදිව හඳුනාගෙන ඇත. නමුත් සමහර අයදුම්කරුවන් වාණිජ බැංකු හෝ මූල්‍ය සමාගම් වල නම් වෙන් වෙන්ව දැක්වීම නිසා ලකුණු අහිමි කරගෙන තිබුණි.

(b) (i) මූල්‍ය ප්‍රතිපත්තිය නිර්වචනය කිරිම වැඩි සිසුන් පිරිසක් නිවැරදිව සිදුකර නොතිබුණි. "මූල්‍ය ප්‍රතිපත්තිය" හා "රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය" සමහර අයදුම්කරුවන් මාරුකර ලියා තිබුණි. AAT ආයතනයේ විසින් මුද්‍රණය කර ඇති ස්වයං අධ්‍යයනය පොතෙහි ද මෙය පැහැදිලිව නිර්වචනය කර තිබුණද, අයදුම්කරුවන් එම පොත නිසියාකාරයෙන් පරිශීලනය කර නොමැති බව පෙනේ.

(ii) සමහර සිසුන් මූල්‍ය ප්‍රතිපත්තියේ උපකරණ පැහැදිලිව හඳුනාගෙන තිබූ අතර, මූල්‍ය ප්‍රතිපත්තිය නිවැරදිව හඳුනා ගැනිමට අසමත්වූ අයදුම්කරුවන්, මූල්‍ය ප්‍රතිපත්තියේ උපකරණද නිවැරදිව දක්වා නොතිබුණි.

**ප්‍රශ්න අංක 04**

(a) මුදල් සැපයුම නිර්වචනය කිරිමට අවශ්‍ය වන සියලු කරුණු එකට ගොනු කිරිමට, නොහැකිවිම නිසා මෙම ප්‍රශ්නයට පිරිනමන මුළු ලකුණු ලබාගැනිමට බොහෝ අයදුම්කරුවන් අපොහොසත් විය. මුදල් සැපයුම මහ බැංකුව විසින් පාලනය කරනු ලබන බව සහ එය වෙනත් මූල්‍ය ආයතන සමඟ අන්‍යෝන්‍යව ක්‍රියා කරනු ලබන බව බොහෝ උත්තර වල දක්වා නොතිබුණි.

(b) (i) මෙම කොටසේ අසා ඇති උද්ධමනයට අදාළ වන හේතු සම්බන්ධයෙන් ලකුණු ලබා ගැනිම අවම මට්ටමක පැවතුණි. මේ සඳහා උත්තර ලෙස සමහර අයදුම්කරුවන් ඉල්ලුම වැඩිවිමට හේතු, ඉල්ලුම් වක්‍රය විතැන්විමට හේතු, සැපයුම වැඩිවිමට හේතු පිළිතුර ලෙස දක්වා ලකුණු අහිමි කරගෙන තිබුණි.

(ii) උද්ධමන අනුපාතිකය වැඩිවීම හේතුවෙන් ශ්‍රී ලංකාව වැනි රටකට ඇතිවන ප්‍රතිවිපාක සඳහන් කිරමේදී සමහර අයදුම්කරුවන් සාර්ථකව උත්තර සපයා ඇත. එකම කරුණ වෙනත් ආකාරයෙන් ඉදිරිපත් කර තිබූ නිසා මුළු ලකුණු ප්‍රමාණයම ලබා ගැනිමට සමහර අයදුම්කරුවන් අසමත්විය. සමහර අයදුම්කරුවන් උද්ධමන අනුපාතිකය වැඩිවීම හේතුවෙන් ආනයන වැඩිවීම වෙනුවට ආනයන අඩුවීම ලෙස වැරදි උත්තර දක්වා තිබුණි. ආර්ථික විද්‍යා සංකල්ප සහ න්‍යායන්ට අදාල ප්‍රායෝගික දැනුම ලබාගැනීමට අයදුම්කරුවන් උත්සුක විය යුතුය.

**ප්‍රශ්න අංක 05**

(a) (i) වෙළඳපොළ මිලට දළ දේශිය නිෂ්පාදිතය ගැලපුම් කිරිමේදි ශුද්ධ වක්‍ර බදු වලට අමතරව, අපනයනද එකතු කිරමෙන් වැරදි උත්තර සපයා ඇත. එමෙන්ම සමහර අයදුම්කරුවන් විදේශ ශුද්ධ සාධක ආදායම ගැලපුම් කර ඇත. අදාළ නොවන ගැලපිම් එකතු කිරිමෙන් එම අයදුම්කරුවන්ගේ උත්තර නිවැරදි නොවිය. සමහර අයදුම්කරුවන් වක්‍ර බදු එකතු කළද සහනාධාර අඩුකර නොමැති වීමෙන් වෙළෙඳපොල මිලට දළ දේශීය නිෂ්පාදිතය ගණනය කිරිමට අපොහොසත් විය.

(ii) වෙළඳපොළ මිලට දළ ජාතික නිෂ්පාදිතය ගණනය කිරිමේදී විදේශිය ශුද්ධ සාධක ආදායම අමතරව, වැරදි සහගත ලෙස අපනයන හා ප්‍රාග්ධන ක්ෂයවීම් ගලපා තිබුණි.

(iii) වෙළඳපොළ මිලට ශුද්ධ ජාතික නිෂ්පාදිතය ගණනය කිරිමේදී, ප්‍රාග්ධන ක්ෂයවීමේ ගැලපිම නිවැරදිව සිදුකළද i හා ii ගණනය කිරිම් නිවැරදි නොවු නිසා, සමහර අයදුම්කරුවන්ට නිවැරදිව පිළිතුර ලබාගැනිමට නොහැකිවිය.

සමස්ථයක් ලෙස i, ii සහ iii කොටස් සඳහා සම්පූර්ණ ලකුණු ලබාගත්තේ අඩු අයදුම්කරුවන් ප්‍රමාණයකි.

(b) ප්‍රධාන සාර්ව ආර්ථික අරමුණු සඳහන් කිරිමේදී අයදුම්කරුවන් වැඩිදෙනෙක් සාර්ථකව පිළිතුරු සපයා තිබුණි. නමුත් සමහර අයදුම්කරුවන් ප්‍රධාන සාර්ව ආර්ථික අරමුණු වෙනුවට රජයේ අයවැය ප්‍රතිපත්ති සඳහන් කිරම ප්‍රධාන සාර්ව ආර්ථික අරමුණු වෙනුවට වෙනත් අනු කරුණු දක්වා තිබීම නිසා ලකුණු අහිමි කරගෙන තිබුණි.

## C කොටස

**ප්‍රශ්න අංක 06**

(a) (i) සමහර අයදුම්කරුවන් විචල්‍ය සාධක හා ස්ථාවර සාධක සම්බන්ධ කරමින් කෙටිකාලය සහ දිගුකාලය නිවැරදිව අර්ථකථනය කළද සමහර අයදුම්කරුවන් කෙටිකාලය යනු වසරකට අඩු සහ දිගු කාලය යනු වසරකට වැඩි කාලයක් ලෙස වැරදි සහගත අයුරන් අර්ථකථනය කර ඇත.

(ii) අයදුම්කරුවන් වැඩි දෙනෙක්, ප්‍රස්ථාරය නිවැරදිව සම්පූර්ණ ලෙස ඉදිරිපත් කර නොතිබුණි. පැවරුණු මිල, MR = MC වන ලාභ උපරිම කිරිමේ නිමැවුම් මට්ටමට හා P = AR හඳුනාගෙන නොතිබුණි. සමහර අයදුම්කරුවන් අක්ෂ නම් කිරිම, වක්‍ර නම් කිරිම සිදු කිරිම අමතක කර තිබුණි.

(b) (i) ඉල්ලුම් සහ සැපයුම් සමීකරණ සපයා තිබු මෙම ප්‍රශ්නයේදී භාණ්ඩයේ සමතුලිත මිල සහ ප්‍රමාණය ගණනය කිරිම අවශ්‍ය විය. බොහෝ අයදුම්කරුවන් (i) කොටස සඳහා සමතුලිත මිල නිවැරදිව ගණනය කර තිබුණි. සමහර අයදුම්කරුවන් (+) / (-) සංඛ්‍යා හැසිරවීමේදී ගණිතමය දෝෂ සිදුකර තිබුණි.

(ii) භාණ්ඩයේ සමතුලිත ප්‍රමාණය ගණනය කිරිමේදී සමහර අයදුම්කරුවන් සමතුලිත මිල නිවැරදිව ආදේශ නොකිරිම, ගණිතමය දෝෂ සිදුකිරිම දක්නට ලැබුණි. මෙවැනි ගණනය කිරිම් නිවැරදිව සූත්‍ර ආදේශ කරමින් සිදුකිරිමට අයදුම්කරුවන් වගබලා ගත යුතුය.

ඉහත අංක (i) හා (ii) කොටස් සඳහා බොහෝ අයදුම්කරුවන් මුළු ලකුණු ලබා ගන්නා ලදී.

(c) බොහෝ අයදුම්කරුවන් සාර්ථකව පිළිතුරු සපයා තිබුණි. අයදුම්කරුවන්ට මුළු ලකුණු ලබාගැනිමට හැකිවු සාර්ථක හා පහසු ප්‍රශ්ණයකි. මුළු ලකුණු ලබා ගැනිමට සමහර අයදුම්කරුවන්ට නොහැකි වුයේ නිවැරදිව පැහැදිලි නොකිරිම හා දැක්වූ කරුණු පැහැදිලි කිරිමට අපොහොසත් වීම නිසයි. ඔවුන් කරුණ පමණක් සඳහන් කර තිබුණි. මේ සඳහා සාමාන්‍ය දැනුම ආශ්‍රයෙන් අයදුම්කරුවන්ට ලකුණු ලබාගත හැකිව තිබුණි.

- - -

**<u>විභාග අයදුම්කරුවන්ගේ සාධන මට්ටම දියුණු කර ගැනීමට සැලකිල්ල යොමු කළ යුතු පොදු කරුණු:</u>**

1. විෂය නිර්දේශය පූර්ණ වශයෙන් හොඳින් අධ්‍යයනය කර තිබීම හා විෂය කරුණු පිළිබඳ වැඩි අවධානය යොමු කිරීම.

2. ප්‍රශ්නය කිහිපවරක් කියවා බලා ප්‍රශ්නයෙන් අසා ඇති පිළිතුර පිළිබඳව නිශ්චිත ඍජු පිළිතුරු සැපයීම කළ යුතු අවස්ථාවලදී අනවශ්‍ය පැහැදිලි කිරීම් / විස්තර ලිවීම් නොකළ යුතුය.

3. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව ප්‍රශ්න පත්‍රයටම අමුණා ඇත. වාස්තවික ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළයුතු ක්‍රියාවකින් යුක්ත වේ. එහි දී ඇති අර්ථකථන වලට අනුකූල වෙමින් උත්තර ලියන්න.

4. මෙම විෂයට අදාල ස්ව-අධ්‍යයන පාඩම්මාලාව, ග්‍රන්ථ, අත්පොත්, ලිපි, සඟරා, මහ බැංකු වාර්තා, ආදිය මැනැවින් පරිශීලනය කිරීම.

5. ප්‍රස්තාර හරියාකාරව නම් කිරීම හා පැහැදිලි කිරීම.

6. පිළිතුරු ලිවීමේදී මූලික න්‍යායාත්මක සංකල්ප නිවැරදිව හඳුනාගැනීමට හා සංසන්දනාත්මකව විමසීමට අවශ්‍ය කුසලතා ගොඩ නැගීම.

7. අත් අකුරු කියවිය හැකි ආකාරයටත් ප්‍රශ්න අංක නිවැරදිව නිසි පරිදි යෙදීමටත් කටයුතු කළ යුතුය.

8. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් නිවැරදිව පිළිපැදීම.

9. පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර හා උත්තර පරිශීලනය කිරීමෙන් තම දැනුම ප්‍රගුණ කළ හැකිය.

10. ආර්ථික විද්‍යා සංකල්ප පිළිබඳ නිවැරදි අවබෝධයක් ලබා ගැනීම තුලින් එකිනෙක සංකල්ප අතර ඇති වෙනස සන්සන්දනාත්මකව ගොනු කිරීමේ හැකියාව තිබිය යුතුය.

11. කාලය මනාව කළමනාකරණය කර ගැනීම.

12. උත්තර පත්‍ර බාරදීමට පෙර ප්‍රශ්න අංක ආදිය නිසිපරිදි යොදා තිබේදැයි නැවත පරීක්ෂා කර බැලීම.

13. පෙර සූදානමක් සහිතව විභාගය සමත්වීමේ පරම චේතනාවෙන් ඉදිරිපත් වීම.

- * * * -